# අධ්‍යාපන සමාජ විද්‍යාවේ කාර්යභාරය පිළිබඳ විමසුමක්

කළුබෝවිටියන සෝරත හිමි

## ප්‍රවේශය

අධ්‍යාපන සමාජ විද්‍යාවේ ස්වභාවය යථා පරිදි අවබෝධ කර ගැනීම සඳහා පළමුව සමාජ විද්‍යාවේ ස්වභාවය හඳුනා ගත යුතුය. ලොව පවතින විද්‍යාත්මක යාන්ත්‍රණයන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා වෙන් කරයි. එනම්,

1. ස්වභාවික විද්‍යාව

2. සමාජ විද්‍යාව

ස්වභාවික ලෝකයේ පවතින සමාජීය සංසිද්ධි භෞතික, රසායනික හා ජෛවමය ලක්ෂණ අධ්‍යයනය කරන ශාස්ත්‍ර ස්වභාවික විද්‍යා ලෙස හඳුන්වයි. උදාහරණ ලෙස භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව හා ජීව විද්‍යාව හැඳින්විය හැකිය. ලෝකයේ පවතින සාමාජීය සංසිද්ධි පිළිබඳව හදාරණ ශාස්ත්‍ර සමාජීය විද්‍යා ලෙස හඳුන්වයි. උදාහරණ ලෙස ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය හා සමාජ විද්‍යාව හැඳින්විය හැකිය. මේ අනුව සමාජ විද්‍යාව අයත් වන්නේ සමාජීය විද්‍යාවන්ට ය. සමාජයේ වාසය කරන විවිධ පුද්ගලයන්ගේ චර්යාව යථාර්ථවාදී ව විග්‍රහ කරන විෂයක් ලෙස සමාජ විද්‍යාව හැඳින්විය හැකිය. මිනිසා අන්තර් ක්‍රියා මගින් ඇතිකරගත් සබඳතා වලින් ඇතිකරගත් සබඳතාවලින් යුත් පුද්ගල හැසිරීම් රටා විද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේ අධ්‍යයනය කිරීම සමාජ විද්‍යාව ලෙස හඳුනාගත හැක.

ලතින් සහ ග්‍රීක වචන දෙකක හා ආභාෂයෙන් ''Sociology'' යන පදය සකස් වී ඇත. 'Socins' යන ලතින් වචනයෙන් මිත්‍රත්වය ද 'Logos' යන ග්‍රීක වචනයෙන් අධ්‍යයනය කිරීම යන්න ද අදහස් කෙරේ. ඒ අනුව සමාජය පිළිබඳ විද්‍යාව ''Sociology'' යනුවෙන් ඉංග්‍රීසියෙන් අර්ථ දක්වා ඇත. ''සමාජ විද්‍යාව සමාජීය ප්‍රපංච හා

මිනිසා අතර ඇති තුලනාත්මක සබැඳියාව තක්සේරු කරනු ලබන විධි ශාස්ත්‍රයයි'' යනුවෙන් J.. Dealy (1905) Text book of sociology කෘතියෙහි නිර්වචනය කර ඇත. (ගලගමගේ. එස්, 2020) ''සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ විද්‍යාව සමාජ විද්‍යාවයි'' (එමිල් ඩුර්කයිම්, 1895) විවිධ නිර්වචන සමාජ විද්‍යාව පිළිබඳ ගොඩනැගී තිබුණ ද අංගසම්පූර්ණ එක් නිර්වචනයක් වෙන්කර හඳුනා ගැනීම අපහසුය. කෙසේ නමුත් අන්තර් මානුෂික සබඳතා යථාර්ථවාදීව හැදෑරීම සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් ඉටුවන ප්‍රධාන කාර්යභාරය වේ. චාල්ස් ඩාවින්ගේ පරිණාමය පිළිබඳ අධ්‍යයනයට පසු සමාජ විද්‍යා ක්ෂේත්‍රය තුළ ද විද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කිරීම සිදුවිය.

සමාජ ප්‍රපංච හා අන්තර් ක්‍රියා අතර ගැටුම්, විවිධ ප්‍රතික්‍රියා විද්‍යාත්මකව හැදෑරීම පහසු වූ අතර සමාජ විද්‍යා නිගමනවල විශ්වීය බවක් හඳුනාගත හැක. නිදසුනක් ලෙස එමිල් ඩුර්කයිම් 1902 සියදිවි නසාගැනීම පිළිබඳ පර්යේෂණය වර්තමානයට ද වලංගු වේ. එබැවින් සමාජ විද්‍යාව, විද්‍යාවක් ලෙස පිළිගැනේ. 1902 එමිල් ඩුර්කයිම් හා 1941 පී. කේ. සොරොකින් සමාජ විද්‍යාව උප ක්ෂේත්‍රවලට බෙදා දක්වා ඇතත්, 1960 දී සමාජ විද්‍යාව ප්‍රධාන විෂය කේෂ්ත්‍ර දෙකක් වශයෙන් බෙදී ගොස් ඇත.

1. ශුද්ධ සමාජ විද්‍යාව - න්‍යායාත්මක දැනුම

2. ප්‍රායෝගික සමාජ විද්‍යාව - ප්‍රායෝගිකව සමාජ විද්‍යාව යොදාගන්නා ආකාරය අධ්‍යයනය කෙරේ.

ප්‍රායෝගික සමාජ විද්‍යාව වර්තමානය උප විෂයයන් 40 කට පමණ බෙදී ගොස් ඇත.

1. කාර්මික සමාජ විද්‍යාව

2. දේශපාලන සමාජ විද්‍යාව

3. අධ්‍යාපන සමාජ විද්‍යාව

4. වෛද්‍ය සමාජ විද්‍යාව

5. ආගමික සමාජ විද්‍යාව

6. නීතිමය සමාජ විද්‍යාව

7. පවුල පිළිබඳ සමාජ විද්‍යාව

8. සංවර්ධන සමාජ විද්‍යාව

යනාදී ලෙස උප විෂය ගණනාවකට සමාජ විද්‍යාව බෙදී වෙන් වී ඇත. ප්‍රායෝගික සමාජ විද්‍යාව ක්ෂේත්‍රයට අයත් ප්‍රධාන උප විෂය ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යාපන සමාජ විද්‍යාව හඳුනා ගත හැකිය.

**අධ්‍යාපන සමාජ විද්‍යාවේ ස්වභාවය**

යම් සමාජයක අධ්‍යාපන ක්‍රියාවලියේ ස්වභාවය අදාළ සමාජයේ පරමාර්ථ අරමුණු හා අවශ්‍යතා මත සකස් විය යුතුය. අධ්‍යාපනය ක්‍රියාත්මක වන්නේ යම් සමාජයක් තුළ බැවින් අධ්‍යාපනය හා සමාජය අතර බැඳීමක් ඇති වන බව ජෝන් ඩුවී පවසයි. සමාජ විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම එමිල් ඩුර්කයිම් මෙන්ම මැක්ස් වේබර් පැහැදිලි ව පෙන්වා දී ඇත. මානව සමාජයේ ආරම්භයේ සිට ආගම හා සදාචාරය මුල්කරගනිමින් අධ්‍යාපනය ක්‍රියාත්මක වූවද එම සමාජය හා අධ්‍යාපනය අතර දැඩි සම්බන්ධතාවයක් ගොඩනැගේ. යම් රටක සමාජ අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් වෙයි. 1960 න් පසුව අධ්‍යාපන සමාජ විද්‍යාඥයින් පුළුල් දෘෂ්ටි කෝණයකින් සමාජය දෙස බැලීමත් සමගම අධ්‍යාපන සමාජ විද්‍යාවට නව මුහුණුවරක් ලැබුණි.

එමිල් ඩුර්කයිම්ගේ කෘත්‍යවාදී එළඹුම අනුව අධ්‍යාපන සමාජ විද්‍යාවේ කාර්යභාරය ද හඳුනාගෙන ඇත. සංකීර්ණ සමාජය තුළ පැනනගින ගැටලු විසඳාගැනීමට බාල පරපුර සඳහා නිසි මඟ පෙන්වීමක් කළ යුතුව තිබේ. ඒ සඳහා අධ්‍යාපන සමාජ විද්‍යාත්මක චින්තනය හැඩ ගැස්විය යුතුවේ. අධ්‍යාපනය සමාජයට ගැළපෙන අයුරින් සැලසුම් කිරීමටත්, එය ක්‍රියාත්මක කිරීමටත් අධ්‍යාපනඥයන්ට අවබෝධ කළ යුතු ආකාරයත්, ඒ සඳහා අධ්‍යාපනය සංවිධානය කළයුතු ආකාරය පිළිබඳව අධ්‍යාපන සමාජ විද්‍යා ක්ෂේත්‍රය පෙරමග ගත යුතු වේ.

ගෝලීය වසංගත තත්ත්වයක් ලෙස කොරෝනා වෛරස් රෝගය ලොව පුරා අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන සිහිනය බොඳ කරමින් ව්‍යාප්ත වන ආකාරයත්, ඒ තුළ සමාජ විද්‍යාත්මකව යථාර්ථවාදීව විද්‍යාත්මක පර්යේෂණය කිරීමත්, ඒ සඳහා අවශ්‍ය විසඳුම්වලට එළඹීමට අධ්‍යාපන සමාජ විද්‍යාවෙන් ලැබෙන උපකාරය සුළුපටු නොවේ. පුද්ගලයෙක් අත්දැකීම් ලබන සියලු ක්‍රියාවලිය අධ්‍යාපන ක්‍රියාවලියක් වශයෙන් පුළුල් ලෙස විග්‍රහ කළ හැකිය. ඒ අනුව පවුල, සමවයස් කණ්ඩායම්, අසල්වැසි කණ්ඩායම්, විධිමත් පාසල ජනමාධ්‍ය හරහා සමාජානුයෝජන ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යාපන සමාජ විද්‍යාව තුළ වැඩි අවධානයකට ලක්කෙරේ. එසේම සංස්කෘතිය අධ්‍යාපන සමාජ විද්‍යාව හා බද්ධවන ආකාරය ඒ සඳහා සමාජානුයෝජන ක්‍රියාවලිය දායක වන අයුරු හඳුනාගත හැක.

පාසල සමාජ සමූහයක් ලෙසත් පාසල් සමූහය හා අනෙක් සමූහ අතර සබඳතා පිළිබඳවත් විෂය තුළින් අවධානය යොමු වී ඇත. ගුරු භූමිකාව පාසල් සංස්කෘතිය, සමාජ වෙනස්වීම්, සමාජ පන්ති, සමකාලීන සමාජ ප්‍රශ්න, බහු සංස්කෘතික අධ්‍යාපනය ආදී ක්ෂේත්‍ර ද වර්තමානයේ අධ්‍යාපන සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයට අන්තර්ගත වී ඇත. සමාජ ගැටලු එක් එක් සමාජයෙන් සමාජයට වෙනස් විය හැක. එක් සමාජයකට ගැටලුවක් වන යම් සංසිද්ධියක් තවත් සමාජයකට ගැටලුවක් නොවිය හැක. එය තෝරා බේරා ගැනීමේ හැකියාව අධ්‍යාපන සමාජ විද්‍යාවෙන් ඉටුවේ. අධ්‍යාපන රටාව කෙරේ බලපාන සමාජ සාධක හා ඒ තුළින් සිදුවී ඇති සමාජ කාර්යභාරය හඳුනාගැනීම, සමාජ සංවර්ධනයට මග පාදා ගතහැකි හැකියාව ලබා ගැනීමත් රටේ පොදු අධ්‍යාපන අරමුණු ප්‍රායෝගිකව විශ්ලේෂණය කිරීමත් අධ්‍යාපන සමාජ විද්‍යාව හරහා ඉටු කර ගත හැක. රටේ සංවර්ධනය ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැලසුම් යථාර්ථවාදීව විශ්ලේෂණය කරමින් රටට අවශ්‍ය ශ්‍රම බලකාය නිෂ්පාදනය කිරීම, අධ්‍යාපන සමාජ විද්‍යාවේ දායකත්වය ලබාගත යුතුය. ඒ සඳහා නිසි මඟ පෙන්වීමක් විෂයමාලාව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් ද ඉටුවේ.

1970න් පසු අධ්‍යාපන විද්‍යාව තුළ සමාජ විද්‍යාත්මක සංකල්ප පිළිබඳව අධ්‍යනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යාපන ක්‍රියාවලියට සමාජ විද්‍යාත්මක සංකල්ප භාවිත කිරීම පිළිබඳ වැඩි

අවධානයක් යොමු විය. වර්තමාන සමාජය තුළ අධ්‍යාපන සමාජ විද්‍යාවේ කේන්ද්‍රස්ථානය විධිමත් පාසල ලෙස හඳුනාගත හැකි අතර අනෙකුත් විධිමත් හා නොවිධිමත් අධ්‍යාපන ආයතන සඳහා අධ්‍යාපන සමාජ විද්‍යාව බලපෑම් සිදුකරයි. ළමයකු පූර්වයෙන් තම පවුල තුළ සමාජානුයෝජන ක්‍රියාවලියට ලක් වුවද විධිමත් පාසල හරහා එය තහවුරු වේ. ඊට අමතරව සමාජ සමාජානුයෝජක කරුණු හඳුනාගත හැකි අතර සමාජ සමූහ අතර අන්තර් ක්‍රියාවලිය නිසි ලෙස විග්‍රහ කිරීම අධ්‍යාපන සමාජ විද්‍යාත්මක නැඹුරුවෙන් හඳුනාගත හැකි වේ. සිසුන්ගේ සමාජ භූමිකා ගුරු පෞරුෂයේ ස්වභාවය පාසල් සංස්කෘතිය පාසලේ සංවර්ධනයට සෘජු ලෙස බලපාන පාසල හා සංස්කෘතිය ද අධ්‍යාපන සමාජ විද්‍යා තුළ දැඩි අවධානයට ලක් වේ. මීට අමතරව පාසල් සමාජ සමූහ අතර පවතින අන්තර් සම්බන්ධතාවය හැදෑරීම අධ්‍යාපන සමාජ විද්‍යාවේ කාර්යභාරය වේ. ගුරුවරයා හා සිසුවා අතරත්, සිසුන් සිසුන් අතර පවතින සම්බන්ධතාවය මෙන්ම ප්‍රජාව සහ පාසල අතර පවතින සම්බන්ධතාවය ද යථාර්ථවාදී ලෙස හැදෑරීම අධ්‍යාපන සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ නිදසුන් කිහිපයක් ලෙස දැක්විය හැකිය. නිසි අයුරින් මගපෙන්වීම යහපත් වූ සමාජ අන්තර් ක්‍රියා සඳහා දිරි ගැන්වීම ද අධ්‍යාපන සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ අවධානයට ලක් කරයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිසි අයුරින් ඉලක්ක ගත කිරීමත් ගුරු භූමිකාව නිසි ලෙස මෙහෙයවීම ද අධ්‍යාපන සමාජ විද්‍යාවේ ප්‍රබල ඉලක්කයක් වේ

ලෝකයේ සෑම රටකම අධ්‍යාපන ක්ෂේත්‍රය පූර්ණ පෞරුෂත්වයෙන් යුත් පුරවැසියන් බිහි කිරීම අපේක්ෂා කරයි. වර්තමාන ගෝලීයකරණය හමුවේ පුළුල් වී ඇති සමාජ ගැටලු නිසිලෙස හඳුනාගැනීමත්, නිසි විසඳුම් නිසි කාලය තුළ අවධානයට යොමු කිරීම අධ්‍යාපන සමාජ විද්‍යාවෙන් මග පෙන්වයි. අධ්‍යාපනය තුළින් පැන නැගී ඇති සමාජ ගැටලු විසඳීම සඳහා නිසි අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම් කිරීම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ කාර්යභාරය වේ. ඒ සඳහා අධ්‍යාපන සමාජ විද්‍යාව වැදගත් වේ.

විශේෂයෙන් අධ්‍යාපන සමාජ විද්‍යාව පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම පහසුව සඳහා එහි උප විෂය ක්ෂේත්‍ර වෙන වෙනම සාකච්ඡා කිරීම වැදගත් වේ. එහිදි,

- සංස්කෘතිය අධ්‍යාපනය සමඟ සම්බන්ධ වන ආකාරය,
- සමාජ සමූහ අධ්‍යාපනයට සම්බන්ධ වන අයුරු,
- අධ්‍යාපනය හා සමාජ ස්ථර අතර අන්‍යෝන්‍ය සම්බන්ධය,
- සමාජ පන්තිය අධ්‍යාපනික සාධක සමඟ සම්බන්ධ වන අයුරු,
- අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සංවර්ධනයට දක්වන දායකත්වය,
- ගෝලීයකරණයේ දී අධ්‍යාපනයේ කාර්යභාරය,

ලෙස උප විෂය ක්ෂේත්‍ර ගණනාවක් හඳුනාගත හැකි අතර එක් එක් උප විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ අධ්‍යාපන සමාජ විද්‍යාත්මක බලපෑම විග්‍රහ කිරීම උචිත වේ.

**සංස්කෘතිය හා අධ්‍යාපනය අතර සම්බන්ධතාවය**

බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥ ඊ.බී.ටයිලර් (Tyler – 1871) ''ප්‍රාථමික සංස්කෘතිය'' (Primary Culture) නම් කෘතියෙහි ප්‍රථමවරට සංස්කෘතිය නිර්වචනය කර ඇත. ''සාමාජිකයෙකු ලෙස මිනිසා විසින් අයත් කර ගන්නා වූ දැනුම, ඇදහිලි, විශ්වාස, නීතිරීති, කලා ශිල්ප, පුරුදු, දක්ෂතා, සාරධර්ම ආදිය ඇතුළත් සංකීර්ණ සමස්තයයි. එයට සමාජයේ පිළිගත් අපේක්ෂා කරනු ලබන අදහස්, ආකල්ප සාරධර්ම, චාරිත්‍ර වැනි හැසිරීම් රටා අයත් වේ. පුද්ගලයා සමාජය තුළ හැසිරීමෙන් මේවා ඉගෙන ගනී. එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට සංස්කෘතිය පවරා දීම සඳහා ඉවහල් වන ප්‍රබල කාරකය අධ්‍යාපනයයි. රැල්ෆ් ලින්ටන් (Linton,1936) නම් ඇමෙරිකානු මානව විද්‍යාඥයාට අනුව සංස්කෘතිය පරපුරෙන් පරපුරට ගෙන යන උගත යුතු දෙයක් බව අර්ථ දක්වයි.

විශේෂයෙන්ම නව පරපුරකට සංස්කෘතිය පිළිබඳ දැනුම ලබා දෙන්නේ අධ්‍යාපනය තුළිනි. දැනුම, ඇදහිලි, විශ්වාස, ආකල්ප, කුසලතා අධ්‍යාපනයෙන් ලබාදෙයි. උප සංස්කෘතියක උපදින දරුවා

විශ්ව සංස්කෘතියක් කරා ගෙන යනු ලබන්නේ අධ්‍යාපනය මගිනි. අධ්‍යාපනයෙන් සංස්කෘතිය පවරා දීමට විවිධ සමාජානුයෝජක කාරක උපකාරී වෙයි . ළමයකුහට තම පවුල තුළින් මූලික අධ්‍යාපනය ලැබෙන අතර, සංස්කෘතිය පවරා දෙන විධිමත් මාර්ගය නම් පාසල් අධ්‍යාපනයයි. පාසලෙන් අධ්‍යාපනය පවරා දෙන ආකාර කිහිපයකි.

I. ශාස්ත්‍රීය විෂයමාලාව (Academic Curriculum)

II. සදාචාර විෂයමාලාව (Moral Curriculum)

III. විෂය බාහිර ක්‍රියා (Extra Curricular Activities)

(ගලගම, 2016)

ශාස්ත්‍රීය විෂයමාලාව විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ සංස්කෘතිය පවරා දෙයි. එම රටේ සමාජ ආර්ථික පසුබිම අනුව කාලීන විෂයමාලාවක් සම්පාදනය කිරීම සිදුකරයි. සංස්කෘතිය ගතික ස්වභාවයක් උසුලන බැවින් එය සමාජයේ අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා පවරා දීමක් සිදුවේ. සදාචාර විෂයමාලාව ඔස්සේ ප්‍රබල ලෙස සංස්කෘතිය පවරා දීම සිදුකළ හැක. සමාජ සාරධර්ම, වැඩිහිටියන්ට සැලකීම, පොදු දේ සුරැකීම, ගුරුවරුන්ට සැලකීම, විනයානුකූල හැසිරීම, පවිත්‍රතාවය ආදිය උදාහරණ වේ. ගුරුවරයා සංස්කෘතිය නියෝජනය කරයි. විෂය බාහිර ක්‍රියාකාරකම් රැසක් පාසල මගින් සංවිධානය කෙරේ. සමිති, සමාගම්, ක්‍රීඩා උත්සව, කලා උළෙල, අධ්‍යාපන චාරිකා, ප්‍රදර්ශන, විද්‍යා දින, සාහිත්‍ය දින වැනි විශේෂ දිනයන් සැමරීම ඉන් කිහිපයකි. සමාජ සම්මත චර්යාවන්ට හැඩගැසීම, සාමූහිකව ක්‍රියාකිරීමේ හැකියාව විෂය බාහිර ක්‍රියාකාරකම් වල නිරත වීම තුළින් ලබා ගනී.

සංස්කෘතිය පරපුරෙන් පරපුරට පවරා දීමේ භාරධූර කාර්යයෙහි නිරත ගුරුවරයා ඉතා වැදගත් භූමිකාවක් නියෝජනය කරයි. ගුරුවරයාට අදාළ සංස්කෘතිය පිළිබඳ පූර්ණ අවබෝධයක් තිබිය යුතු අතරම එය ඇගයීමට ලක් කිරීමටත් සෙසු සංස්කෘතීන් හෙළාදැකීම නොකළ යුතු බවත් අවබෝධ කරවිය යුතුවේ. ගතික ස්වභාවයක් උසුලන සංස්කෘතිය තුළ වෙනස්වීම් වලට උචිත ලෙස හැඩ ගැසීමට බාල පරපුර දිරිගැන්වීම ගුරුවරයා සතු යුතුකමකි.

විශ්වීය සංස්කෘතියක අගය බහු සංස්කෘතික අධ්‍යාපනය තුළින් බාල පරපුරට අවබෝධ කර දීම වැදගත් වේ. උප සංස්කෘතික බලපෑම් වලින් තොරව සම අධ්‍යාපන අවස්ථා මතුකර ගැනීමට අධ්‍යාපන සමාජ විද්‍යාත්මක ඥානය පිටුවහලක් වේ. ඇතැම් සමාජ සංස්කෘතිවල සමවසම් අර්ථ ක්‍රම, සමාජ පංති ගැටුම්, දුගී බව යනාදී ප්‍රශ්න උප සංස්කෘතීන් තුළ  සම අධ්‍යාපන අවස්ථා අහිමි කරනු ලබයි. එවන් අවස්ථා නිවැරදිව අවබෝධ කරගැනීමට අධ්‍යාපන සමාජ විද්‍යාත්මක ඥානය ඉවහල් වේ.

බහු ආගමික, බහු ජාතික, බහු වාර්ගික ලෙසින් බෙදී වෙන්වී ගිය සමාජයක බහු සංස්කෘතික තත්වයක් හටගනී. එවැනි සංස්කෘති දෙකක් හෝ කිහිපයක් පවතින විට ඒ සඳහා ගැළපෙන අධ්‍යාපනය බහු සංස්කෘතික අධ්‍යාපනය ලෙස හඳුනාගත හැකිය. සුළු ජාතික ජන කොටස්වල සංස්කෘතික ලක්ෂණ ප්‍රධාන පාසල් විෂයමාලාවට ඇතුළත් කිරීම තුළින් ඇමෙරිකානු සමාජය තුළ (1960 දශකයේ) බහුසංස්කෘතික අධ්‍යාපනික සංකල්පය ආරම්භ විය. අධ්‍යාපනයේ සම අවස්ථා ලබාදීම බහු සංස්කෘතික අධ්‍යාපනය තුළින් අපේක්ෂා කරයි. වාර්ගික, ජාතික හා ජාත්‍යන්තර අනන්‍යතාව පිළිබඳ පොදු ගැටලු සැලකිල්ලට ගනිමින් එම අංශ අතර සහජීවනයක් ඇති කරමින් අධ්‍යාපන සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය කටයුතු කළ යුතු වේ.

පාසලක සම්ප්‍රදායන්, ආකල්ප, ප්‍රතිමාන, විශ්වාස වැනි අංග පාසලට ආවේණික චාරිත්‍ර වාරිත්‍ර, පාසලේ සන්නිවේදන රටාව, විවිධ ගැටුම් යනාදිය පාසලක සංස්කෘතිය ප්‍රදර්ශනය වන සාධක වෙයි. මෙම සංස්කෘතික අංග පාසලෙන් පාසලට විවිධ වන අතර එය එම පාසලට අනන්‍යතාවයක් එක්කරයි. පාසල් සංස්කෘතිය ද ගතික වන අතර බාහිර පරිසරය සමග අන්තර් ක්‍රියාකාරීත්වයෙහි  ප්‍රතිඵලයක් ලෙස පාසලේ ප්‍රතිරූපයට ද විවිධ අයුරින් බලපෑ හැක. පාසල් සංස්කෘතිය ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ සංස්කෘතියක් ගොඩනැංවීමෙහිලා මූලික වෙයි. පන්ති කාමරය තුළ ගුරුවරයාට පැවරී ඇති ප්‍රධාන කර්තව්‍යයක් නම් ඵලදායි පාසල් සංස්කෘතියක් ගොඩනංවාලමින් පූර්ණ පෞරුෂයෙන් යුත් දරු පරපුරක් දැයට දායාද කිරීමයි. ඒ සඳහා බොහෝ විට විදුහල්පති හා පාසල් දැක්ම ප්‍රබල ලෙස දායකත්වයක් දරයි.

**සමාජ සමූහ හා අධ්‍යාපනය** (social groups and education)

මිනිසාගේ සාමූහික ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනය කිරීම සමාජ විද්‍යාවේ කාර්යභාරය වන අතර, අධ්‍යාපන ක්‍රියාවලියේ දී සාමූහික ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම අධ්‍යාපන සමාජ විද්‍යාවේ මූලික කාර්යය වේ. සමාජ සමූහයක් අතර අන්තර් ක්‍රියාවන් පැවැතීම සමාජ සමූහයක ප්‍රධාන ලක්ෂණයක් වේ. අධ්‍යාපන ආයතන කේන්ද්‍ර කරගෙන සමාජ සමූහ ගණනාවක් බිහි වේ. එහි දී පාසල් සිසුන්ගේ සබඳතා අධ්‍යයනය කිරීම සඳහා පාසල් සමූහ හඳුනා ගැනීම වැදගත් වේ. පාසලක සමාජ සමූහ විධිමත් හා අවිධිමත් ආකාරයෙන් බිහි වන අතර දරුවන්ගේ අධ්‍යාපනයෙහි ප්‍රතිජනනාත්මක හා ප්‍රතිශේධාත්මක ලෙස ද බලපෑ හැක. ඇතැම්විට පාසලක අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට බලපෑම් ඇතිවිය හැක. කාර්යක්ෂම විදුහල්පතිවරයකුගේ මෙන්ම ගුරුවරයකුගේ මූලික කාර්යභාරය වන්නේ පාසැලෙහි බිහිවී ඇති විධිමත් හා අවිධිමත් සමූහ නිසි ලෙස හඳුනා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට කටයුතු සැලසුම් කිරීමයි.

**සමාජ ස්ථරායනය හා අධ්‍යාපනය** (Social Statification and Education)

යම් සමාජයක සාමාජිකයන් විවිධ කාලාපවලට ස්ථානගත වී තිබීම, සමාජ ස්ථරය ලෙස අදහස් කරයි. ''ස්තරායනය යම්කිසි සමාජයක සිටින සාමාජිකයන් වර්ගකර අගය කිරීමේ මිනුමක් සහ සාපේක්ෂ සමාජය පිළිගත් වැදගත් අංශවලින් පහත් හා උසස් ලෙස සැලකීමයි (ටැල්කොට් පාසන්ස්). සමාජ සමූහ උසස් හා පහත් ලෙස සැලකීම, ඒ අනුව ක්‍රියා කිරීම, සමාජය යම් ධුරාවලියට බෙදා ස්තරායනය මූලික ලක්ෂණ වේ නිර්වචන තුලින් ද තහවුරු වේ.

**ස්ථරායනයේ පොදු ලක්ෂණ**

1. සමාජ ප්‍රභේදනය
2. තරාතිරම තීරණය කිරීම
3. අගය කිරීම
4. පාරිතෝෂකය (වන්නියගම, 2004)

අධ්‍යාපනයට පිවිසීම, අධ්‍යාපන උපයෝජනය, අධ්‍යාපන සාධනය හා අධ්‍යාපන ඵල යන සියලු අවස්ථා සමාජ ස්තර සම්බන්ධ වේ. දරුවකුගේ අධ්‍යාපනයට සමාජ ස්තරායනය ඍජු හෝ වක්‍රව බලපායි. වරප්‍රසාද සහිත හෝ රහිත සමාජ ස්තරවල අධ්‍යාපනය ලැබීමේදී පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ අවාසිදායක පරිසරයේ අධ්‍යාපන අවස්ථා පිළිබඳ අධ්‍යයනයකින් (රූපසිංහ, 1997) සමාජ, ආර්ථික ස්තරය ඉහළ පවුල්වල දෙමාපියන් එම ප්‍රදේශයේ පාසල්වලට තම දරුවන් ඇතුළත් කිරීමට මැලිකමක් දක්වා ඇති බව හඳුනා ගෙන ඇත. ඊට හේතු ලෙස සමාජ පිළිගැනීම හා පහසුකම් පහළ මට්ටමක පැවතීම සඳහන් කර ඇත. මෙවන් සමාජ විෂමතා හඳුනාගනිමින් අධ්‍යාපනයේ සම අවස්ථා සලසාදීම අධ්‍යාපනය හා සමාජ විද්‍යා විෂය පථය අවබෝධ කරගැනීමෙන් කළ හැක.

## සමාජ වෙනස්වීම් හා අධ්‍යාපනය (Social Changes and Education)

නිශ්චිත එක් අවස්ථාවක සිට තවත් නියමිත අවස්ථාවක් අතර පරතරය වෙනස්වීමක් ලෙස හඳුනා ගත හැකිය. වෙනස් වීමක් යනු කල් පවත්නා අනන්‍යතාවකින් යුතු කාලීන වෙනස්කම් වල අනුප්‍රාප්තියයි (Robet Roisbet - 1971). මේ අනුව ගතික වූ සමාජයක් නිරන්තර වෙනස්වීම්වලට ලක්වේ. වෙනස්වීම් කාලීන බවින් හා කල්පවතින අනන්‍යතාවකින් යුක්ත බව සඳහන් වේ (ගලගම, 2014).

සමාජය වෙනස් කිරීමට මුල්වන ප්‍රධාන කාරකයක් ලෙස අධ්‍යාපනය හඳුන්වා දිය හැක. එමිල් ඩුර්කයිම් ද අධ්‍යාපනය සමාජය වෙනස් කිරීමට බලපාන බව පවසයි. රටක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමාජය වෙනස් කිරීමට පුරෝගාමී වේ. නමුත් නවීකරණය ඉතා සෙමෙන් සිදු වුවත් වර්තමාන කොවිඩ් 19 වසංගතය හමුවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යම් වෙනසකට අඩිතාලම දමමින් පවතී. මෙතෙක් රටේ මාර්ගගත අධ්‍යාපනය ප්‍රමුඛව සිදු නොවුවද වසංගත සමයේ පාසල් වසා තැබීමත්, අධ්‍යාපන අවස්ථා ලබා දිය යුතු වීමත් මත ඒ සඳහා පැවති එකම විකල්පය මාර්ගගත අධ්‍යාපනය ප්‍රචලිත විය. බොහෝ දුෂ්කරතා ගැටලු හමුවේ වුවද ගෝලීයකරණය හමුවේ මෙවර අධ්‍යාපන ක්ෂේත්‍රය ද යම් වෙනසකට භාජනය විය. එය දුෂ්කරතා අවම කර ගැනීමට සැලසුම් සකස් කිරීම මගින් වඩාත් සාධනීය තත්ත්වයකට යොමු කළ හැක.

**අධ්‍යාපනය ආයෝජනයක් ලෙස හඳුනාගැනීම**

අධ්‍යාපනය ආයෝජනයක් ලෙස 21 සියවසේ අධ්‍යාපන බලධාරීන් තේරුම් ගෙන තිබේ. තිරසාර සංවර්ධන සංකල්පය කරළියට පැමිණ ඇති වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රය,

I. ප්‍රජා ආර්ථික සංවර්ධනය

II. සංරක්ෂණය

III. පරිසර විද්‍යාව

යන අංශ ඔස්සේ සංවර්ධනය කිරීම අපේක්ෂා කරයි. අධ්‍යාපනය රටක ආයෝජනයක් ලෙස 1776 ඇඩම්ස්මිත්ගේ ''ජාතීන්ගේ ධනය'' නැමැති ග්‍රන්ථයෙහි සඳහන් කරයි. නමුත් තිරසාර සංවර්ධනය හමුවේ ජෛව ගෝලය, පරිසරය, ජල පෝෂක, වනජීවීන් හා පස පිළිබඳව ච අවධානය යොමු කරයි. මිනිසා ජීවත්වීමට අවැසි පෘථිවිය සංරක්ෂණය කරගැනීම අධ්‍යාපන සමාජ විද්‍යාව විෂය ක්ෂේත්‍රය තුළ අවධාරණයට ලක් කරයි. තවදුරටත් අධ්‍යාපනය සමාජ ප්‍රාග්ධනයක් පමණක් නොව එය සංස්කෘතික ප්‍රාග්ධනයක් බවත් එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපන වටිනාකම ඉහළ යාමට හේතුවන බව පැහැදිලි වේ. යම් ප්‍රජාවක පුද්ගලයින් සාමූහික ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් පුද්ගලයා හා කණ්ඩායමක් ලෙස ලබා ගන්න ප්‍රතිලාභ හා සම්පත් සමාජ ප්‍රාග්ධනය ලෙස සලකයි. ''රොබට් පුටිනම්'' නම් සමාජ විද්‍යාඥයා එහි නිර්මාතෘ වේ.

තවදුරටත් අධ්‍යාපන සමාජ විද්‍යාව පිළිබඳ විග්‍රහ කිරීමේදී පාසල කෙරෙහි ප්‍රජාවේ බලපෑම් හා ගැටලු හඳුනා ගත හැක. පාසල හා අන්තර් සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස සමාජ ගැටලු පැනනැගිය හැක. එසේම හිතකර බලපෑම් ද ඇති විය හැක. යහපත් ප්‍රජා සබඳතා වලින් යුත් පාසලක ගුරු සිසු, දෙමාපියන්, ආදි ශිෂ්‍ය, පරිත්‍යාගශීලීන්ගේ ක්‍රියාකාරී අන්තර් සබඳතා හේතුවෙන් ප්‍රජා පාසලක් බවට පත් වේ. අවසානයේ පාසල් සංවර්ධනයට මෙන්ම සමස්ත රටෙහිම සංවර්ධනයට එම තත්ත්වය හිතකර ලෙස බලපායි. 1972 ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවෙහි මෙන්ම, 1990

තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව තුළින් ද ප්‍රජා පාසල් ප්‍රජාවහි වැදගත්කම අවධාරණය කර ඇත. පාසල් ප්‍රජා සබඳතා යහපත් කිරීමට සමාජ විෂයමාලාවක් ක්‍රියාත්මක කළ යුතු බව සේනාධීර, (2003) සඳහන් කර ඇත.

## සමාලෝචනය

සමාජයක ශිෂ්ඨ සම්පන්න අගයන් පවත්වා ගෙන යාම සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය හුදෙක් ම විෂය කරුණු පිළිබඳ දැනුම ලබා දීමට වඩා ඉන් ඔබ්බට යා යුතුව ඇත. සෑම පුද්ගලයෙකු ම තමන් එම සමාජයේ ඵලදායි පුද්ගලයෙකු යැයි අවබෝධ කරගෙන සිටීම පුද්ගලයාගේ පෞරුෂ වර්ධනය සඳහා බෙහෙවින් අවශ්‍යවේ. ශිෂ්‍යයන්ගේ ස්ව සංකල්පය ප්‍රතිජානාත්මක ස්ව සංකල්පයක් ලෙස වර්ධනය වීම, ඔවුන්ගේ ශිෂ්‍ය පෞරුෂ සංවර්ධනය හා සමාජ සංවර්ධනය සඳහා බෙහෙවින් බලපායි. අධ්‍යාපනය, සමාජය තුළ පන්ති පන්ති විෂමතාව අවම කිරීම සඳහා ඉහළ සචලනයක් ඇති කරන කාරකයක් ලෙස සලකයි. සමාජ සචලනය යනු එක් සමාජ ස්තරයක සිට තවත් සමාජ ස්තරයකට ගමන් කිරීමයි. එය තිරස් හා සිරස් ආකාරයෙන් සිදු විය හැකි අතර, අධ්‍යාපනයේ සාර්ථකත්වය මත ඉහල සමාජ සචලනයක් හෝ පහළ සමාජ සචලනයක් සිදුවිය හැක. රටේ ප්‍රතිපත්ති තීරකයින් සැළසුම් සම්පාදකයින් වඩා අර්ථවත් අධ්‍යාපන අවස්ථා සැලසීමෙන් ඉහළ සමාජ සචලනයක් ඇති කරගැනීමට ඉඩකඩ සැලසිය හැක. අධ්‍යාපන සමාජ විද්‍යාව උප විෂය ක්ෂේත්‍රය පුරාවට අධ්‍යාපනය හා සබැඳි පුද්ගල අන්තර් ක්‍රියා මත ගොඩනැගෙන සමාජ තත්වයක් තත්ත්වයක් හඳුනා ගත හැක. පාසල් දරුවන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව ඉටුකර ගැනීමට අවස්ථා සම්පාදනය මගින් අධ්‍යාපන ගැටලු අවම කර ගනිමින් සමාජ සාධාරණත්වයක් අධ්‍යාපනය හරහා ඇති කළ හැකිවේ. ඒ සඳහා අධ්‍යාපන සමාජ විද්‍යා විෂය පථය පුළුල් දායකත්වයක් දරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. ගලගම, එස්. (2014) ''*අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම*'',කතෘ ප්‍රකාශන.
2. ගලගම, එස්. (2016) ''*අධ්‍යාපන සමාජ විද්‍යා මූලධර්ම.*'' කතෘ ප්‍රකාශන.

3. ගලගම, එස්. (2020) ''*අධ්‍යාපන සමාජ විද්‍යා චින්තන.*'' කතෘ ප්‍රකාශන.

4. ජයසේන, අසෝකා. (2010) "*අධ්‍යාපන සමාජ විද්‍යාව*". කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

5. බුත්පිටිය, ජයසේන. (2006) ''*අධ්‍යාපනික සාමාන්‍ය දැනීම 1.*'' කර්තෘ ප්‍රකාශන.

6. රූපසිංහ, සිරිපාල. (2004) "*අධ්‍යාපනය හා සමාජ සංවර්ධනය*" කොට්ටාවඃ සාර ප්‍රකාශන

7. වන්නියගම, චන්ද්‍රදාස. (2004) ''*අධ්‍යාපන විමර්ශන 2.*'' කර්තෘ ප්‍රකාශන.

8. සේනාධීර, සිල්වි. (2010) "*අධ්‍යාපනය සඳහා සමාජානුයෝජන කාරකවල වැදගත්කම.*" කොළඹ 10 : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

9. හෙට්ටිආරච්චි, කුමාරදාස. (1999) "*අධ්‍යාපන සංවර්ධනය.*" කොළඹ : 10 ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.